කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

පුර්ණ රජය සතු සමාගමකි

# වාර්ෂික වාර්තාව

## 2014/2015


**ප්‍රධාන කාර්යාලය**
561/3,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

| | | |
|---|---|---|
| දුරකතන | : | 011 - 2368738 |
| ෆැක්ස් | : | 011 - 2058062 |
| විද්‍යුත් තැපැල | : | kgll@sltnet.lk |
| වෙබ්අඩවිය | : | www.kgraphite.lk |

**පතල් කාර්යාලය**
මඳුරාගොඩ,
දොඩන්ගස්ලන්ද.

| | |
|---|---|
| දුරකතන | : 037-2252015 |
| ෆැක්ස් | : 037-4931711 |

# අ න් ත ර් ග ත ය


| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 02 |
| විගණන කමිටු වාර්තාව | 06 |
| ආයතනික දැක්ම, මෙහෙවර හා අරමුණු | 07 |
| සංවිධාන ව්‍යුහය | 08 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 09 |
| විශේෂ ගිණුම්කරණ තොරතුරු | 12 |
| වාර්ෂික ගිණුම් | 13 |
| රැස්වීම පිළිබඳ දැන්වීම | 14 |
| පෙරකලාසි ආකෘති පත්‍රය | 15 |

# හැඳින්වීම

## කහටගහ මිනිරන් පතල් වැඩබිම

“කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්” සමාගම මඟින් කළමනාකරණය කරනු ලබන කහටගහ පතල පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90ක් පමණ දුරින් වූ මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද ප්‍රදේශයෙහිය. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන සම්පූර්ණයෙන් රජය සතු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලද එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාය. විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදකයා වන අතර ආයතනික ප්‍රතිපත්තිවල හරය උකහාගන්නේ එහි රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයෙනි.

රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මදුරාගොඩ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ පිහිටි කහටගහ පතල මුහුදු මට්ටමේ සිට මීටර් 25ක් උසින් කඳුකර පෙදෙසක, ආසන්න වශයෙන් අක්කර 102ක භූමි භාගයක පිහිටා තිබෙන අතර එම අක්කර 102න් අක්කර 76ක වූ පොල් වගාවද ‘කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්’ සමාගම මඟින් කළමනාකරණය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ, බෝගල පතල සහ කහටගහ පතල යනුවෙන් නම්කර ඇති ප්‍රධාන පතල් දෙකකි. 1872 සිට මෙහෙයුම් කටයුතු සිදු කෙරුණු කහටගහ පතල, කහටගහ සහ කොලොන්ගහ යන පතල් දෙකෙහි එකතුවකි. 1973 වර්ෂයේ රජය යටතට ගත් පසුව මෙම පතල් දෙක එකතුකොට එක් පතලක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

පතල් ආවාට දෙකක් මගින් ප්‍රවේශ විය හැකි අඩි 2000 (මීටර් 610) ක ගැඹුරකින් යුක්ත කහටගහ පතල වූ කලී ශ්‍රී ලංකාවේ ගැඹුරුතම පතලයි. කහටගහ පතල් ආවාටය අඩි 1132 ( මීටර් 345 ) ක් වන අතර කොලොන්ගහ අඩි 330 (මීටර් 101 ) මට්ටම දක්වා ගමන් කරයි. මෙම ආවාට වෙන වෙනම ස්ථාන දෙකකින් මිහිතුල දක්වා කැණීම් කර ඇත. පහළ ඇති පතල් ආවාටයේ ප්‍රවේශය වන්නේ අඩි 2000 (මීටර් 610 ) ක් දක්වා වූ වින්ච් (winch) මාලාවයි. ප්‍රධාන විංචිය සහ අනෙකුත් විංචි මිහිතුල කම්කරුවන් අඩි 1132 සිට අඩි 2000 මට්ටම දක්වා විවිධ මට්ටම් වලට ගෙන යාමට යොදාගනු ලබයි. පතල, එහි පුළුල්ම ස්ථානයේදී මීටර් 500ක් තරම් දක්වා වූ දුරකට ව්‍යාප්ත වේ.

### කහටගහ නිෂ්පාදනයන්හි අනන්‍ය බව

ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් සපයන අනන්‍ය සැපයුම්කරු ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම, කහටගහ පතල 99%ට වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත සම්පූර්ණයෙන් ස්ඵටික බවට පත්වූ ස්වරූපයෙන් පවතින ඉහළ පිරිසිදුභාවයකින් යුත් ස්වභාවික ඉල්ලම් මිනිරන් කැණීමේ හැකියාවක් සහිතය. එය ඉදිකටු වැනි සිහින් තුඩැති කූරු, කුට්ටි සහ පතුරු වශයෙන් දැකගත හැකි අතර අඩු භාෂ්මිතිකතාවක් සහිත ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත් ස්ඵටික ඉල්ලම් මිනිරන් වශයෙන් බහුලව පවතී. තවද, ලොව පිළිගත් අනන්‍ය නිෂ්පාදනයක් වශයෙන් ලෝක වෙළඳපොළෙහි කීර්තිනාමයක් තහවුරු කරගෙන තිබේ.

# ස භා ප ති තු මා ගේ  ස මා ලෝ ච න ය

2014/2015 ගිණුම් වර්ෂය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් පිළිබඳ මාගේ සමාලෝචනය ඉදිරිපත් කරමි. මා 2015.11.23 දින සිට මෙහි සභාපති වශයෙන් කටුයතු කරන අතර මෙම සමාලෝචනයට යටත් කාල සීමාව සෘජුවම මාගේ ධූර කාලය තුල නොවන බව කිව යුතුය. මිනිරන් පිළිබඳ උනන්දුවක් දක්වන බොහෝ විදේශ ආයෝජකයන් සමඟ කහටගහ මිනිරන් භාවිතා කරමින් අගය එකතු කිරීමේ වැඩසටහන දිගටම කරගෙන යාමට කටයුතු කර ඇති නමුත් එයින් ද ඵලදායී ප්‍රතිඵලයක් නොමැත. කෙසේ නමුත් සාම්ප්‍රදායික ගැනුම්කරුවන්ට කහටගහ මිනිරන් අපනයනය කිරීමේ ක්‍රියාවලිය පෙර දශක දෙක තුලදී මෙන්ම නොනැවතී කරගෙන යනු ලබයි.

## නිෂ්පාදනය

2014/2015 ගිණුම් වර්ෂය තුල කණින ලද මිනිරන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 712.0 කි. මෙය පෙර වර්ෂයේ නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 848.13 හා සසඳන කල 16 ක ප්‍රතිශතයකින් අඩු වීමක් වන අතර එසේ අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ අධික වර්ෂාවත් සමඟ මිහිතුල අඩි 2000 මට්ටමේ සිදුවූ ජලගැලීම් තත්වයයි. මේ නිසා මිනිරන් බහුල වැඩපලවල් වල වැඩකටයුතු නතර කිරීමට සිදු විය. මිහිතුල ජල ගැලීම් සිදුවූ ස්ථාන වල ජලය පොම්ප කිරීම සඳහා සියලු සේවකයින් යොදා ගැනීමට සිදුවිය. ඊට අමතරව 2014 වර්ෂයේ, ප්‍රධාන වශයෙන් 2014 දෙසැම්බර් මාසය තුල, සේවා ස්ථිරත්වය ඉල්ලමින් සිදුකල සේවක වැඩ වර්ජන මෙසේ නිෂ්පාදන පහත වැටීමට දායක වී ඇත.

## විකුණුම්, අලෙවිකරණය සහ මූල්‍ය තත්වය

මෙම අවර්ෂයේදී අපනයනය සඳහා සැකසූ මිනිරන් මෙට්‍රික් ටොන් 708 ක් රුපියල් මිලියන 122 ක මිලකට අපනයනය කර ඇති අතර පෙර වර්ෂයේ රුපියල් මිලියන 144 ක ආදායම හා සසඳන කල එයින් සමාගමේ ආදායම රුපියල් මිලියන 22 කින් අඩු වී තිබේ. මෙසේ අඩු ආදායම් ලැබීමට හේතු වූයේ සාමාන්‍යයෙන් ඉහල තත්වයකින් යුත් 97/99% C ශ්‍රේණිවල මිනිරන් ඉල්ලුම් කරන ඇමෙරිකාවෙන් සහ එක්සත් ජනපදයෙන් ලද ඇණවුම් ප්‍රමාණය අඩු වීමයි. තවද සෑම හය මාසයකටම වරක් මිළ වැඩි කිරීමේ ක්‍රමවේදය ද නිතරම ගැනුම්කරු ප්‍රධාන කොටගත් වෙළෙඳපොලක් ඇති මිනිරන් වෙළෙඳපොලෙහි අපගේ සාම්ප්‍රදායික ගැනුම්කරුවන් කෙරෙහි තදින්ම බලපාන ලදී.

අපගේ මිනිරන් තොගය විකුණා ගැනීම සඳහා සමාගමේ මාසික විකුණුම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 60 දක්වාවත් ඉහල නංවා ගැනීමට සිදුවන අතර ඒ සඳහා නව මිනිරන් ගැනුම්කරුවන් සොයා ගැනීමට හා ඔවුන් රඳවා ගැනීමට සිදු වේ. එම කටයුත්ත සඳහා ඉතා ඉක්මනින් වෙබ් අඩවියක් හඳුන්වා දීමට හා අලෙවිකරණ අංශයේ තියුනු අධීක්ෂණය යටතේ එම වෙබ් අඩවිය පවත්වාගෙන යාමට වෙනම නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමින් සිටී.

## පතලේ මිහිතුල සංවර්ධනය හා ගවේෂණ කටයුතු

සමාලෝචිත වර්ෂයේදී මිහිතුල මට්ටම් දෙකක සිදු වූ ජල ගැලීම් නිසාවෙන් සංවර්ධනය කිරීම බරපතල ප්‍රශ්නයක් විය. මෙම ප්‍රශ්නය තවදුරටත් පවතින අතර නැවත ජලගැලීම් තත්වයක් ඇති වේ යැයි අවධානමක අප සිටී. අපගේ හොඳම තත්වයේ මිනිරන් සපයන ප්‍රදේශ වඩාත් පහල මට්ටම් වල පවතී. එක් බිඳ වැටීම් අවස්ථාවකදී භාවිතය සඳහා තවත් අමතර මෝටරයක් ද අවශ්‍ය වේ.

පතලේ මිහිතුල සංවර්ධනය කෙරෙහි බලපාන තවත් එක් බාධකයක් නම් ඉවත් කරන අබලි ගල් ය. මිහිතුල සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් ඉවත් කරන ගල් හා මිහිතුල ජලය ඉවත් කිරීමේ ප්‍රශ්නයන් විසඳා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. 2015 සැප්තැම්බර් මාසයේදී මිහිතුල ජලගැලීම් තත්වය පාලනය කල අතර නිෂ්පාදනය නැවත ආරම්භ කරන ලදී. අලුතින් දෝනා කැණීම මඟින් සොයාගත් ඉහල සඵලතාවයකින් යුතු ඉල්ලම් වෙත ලඟා වී නිෂ්පාදනය ආරම්භ කර ඇත. දෙවන ආවාටයේ කැණීම් කටයුතු ඉදිරියට කරගෙන යන අතර රුපියල් මිලියන 3.2ක් වැය කරමින් ප්‍රධාන විංචියට වානේ කම්බි රැහැනක් අලුතින් යොදා ඇති අතර බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා මිහිතුල ප්‍රධාන යන්ත්‍ර සත්‍ර වලට නව ධාරිත්‍රක සවි කරන ලදී.

## සැකසුම්, ඇසුරුම් පද්ධතිය හා මිහිපිට ගොඩනැගිලි

සැකසුම් පද්ධතිය හා මිහිපිට ගොඩනැගිලි නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 13.36 ක් වැයකර ඇත. ට්‍රොමල් (Trommel) , කන්වෙයර්ස් (Convayers) සවිකිරීම, ෂූට් (chute) ඉදිකිරීම, වියලුම් අංගනය හා ඇසුරුම් කුටි ඉදිකිරීම, ගොඩනැගිලි හා කහටගහ පතල් භූමියෙහි ඇති සියලුම මාර්ග පද්ධති අලුත්වැඩියා කිරීම ආදී කටයුතු අවසන් කර ඇත. මූලික වෙන් කිරීමේ පද්ධතිය යාන්ත්‍රීකරණය කිරීම හා යටිතල පහසුකම් සැපයීම හේතුවෙන් සේවක කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය වී ඇත.

## පොල් වගාව හා වතු සංවර්ධනය

සමාගම මේ වන විටත් අක්කර 52 ක ප්‍රමාණයක නැවත පොල් වගා කිරීමේ කටයුතු සිදුකර ඇති අතර පොල් ඉඩම ඉතා හොඳින් කළමනාකරණය කරමින් ඒ වෙනුවෙන්ම වෙන් කල සේවකයින් 08 දෙනෙකු විසින් වගාවේ යටිතල පහසුකම්, පොහොර යෙදීම යනාදී නඩත්තු කටයුතු කරනු ලැබේ. යටිරෝපණ ව්‍යාපෘතිය යටතේ මුලින්ම අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව ගම්මිරිස් පැල 1200 ක් පමණ මෙම වර්ෂය තුල වගාකල අතර එහි නඩත්තු කටයුතු නිසිපරිදි සිදුකරනු ලබයි.

කෙසේ නමුත් අක්කර 102 ක් වූ පතල් භූමි භාගයෙන් අක්කර 50 ක පමණ ප්‍රමාණයක් සඳහා තවමත් තීන්දු නොවූ උසාවි නඩු කටයුතු පවතින බැවින් එම භූමිය දෙපාර්ශවයෙන් එක් පාර්ශවයකගේවත් පාවිච්චියකින් තොරව ටිකෙන් ටික වල් බිහිවෙමින් පවතී.

## සේවක සුභසාධනය හා ගැටළු

සේවා සේවක සහභාගිත්ව කළමනාකරණය තුලින් සේවක අභිප්‍රේරණය හා සම්පත් වල කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහල නැංවීමට කටයුතු කර ඇත. අවධානම් ස්වභාවය හා අසීරු සේවා පරිසර තත්වය හේතුවෙන් මිහිතුල සේවකයින්ගේ චර්යාවන්, මිහිපිට සේවකයින් හා බලන කල්හි විශාල වෙනසක් දක්නට ලැබේ.

සේවකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් නිසි වේලාවට කැණීම් ආරක්ෂණ උපකරණ හා ආරක්ෂණ ඇඳුම් සපයා ඇති අතර මිහිතුල උපකරණ සියල්ල හා විශේෂයෙන් එසවීමේ පද්ධතිය නිසි පරිදි නඩත්තු කරනු ලැබේ. රිදීගම රෝහලේ වෛද්‍යවරයෙක් සතියකට වරක් පතලට පැමිණෙන අතර සියලුම සේවකයන්ට හා ඔවුන්ගේ දරු පවුල් වලටද අවශ්‍ය වෛද්‍ය සේවාවන් ලබා ගැනීමට කටයුතු සලසා ඇත. මේ සඳහා සමාගමේ වෛද්‍ය මධ්‍යස්ථානය භාවිතා කරන අතර මූලික වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ගද ආයතනය මඟින් නොමිලේ සපයනු ලැබේ.

කෙසේ වෙතත් මෙම වර්ෂය තුල සේවකයින්ගේ රැකියා සුරක්ෂිතතාවයක් නොමැති බැවින්, සේවා ස්ථිරත්වය ලබාගැනීමට හා සමාගමට ස්ථිර පිරිස් සැලැස්මක් ලබාගැනීමට ගරු ඇමතිතුමා මාර්ගයෙන් කැබිනට් පත්‍රිකාවක් යොමුකරන ලෙස ඉල්ලමින් සිදුකල සේවක වැඩවර්ජනයක් වාර්තා විය.

ඊට අමතරව රට තුල අස්ථායී දේශපාලන වාතාවරණය සහ කළමනාකරණයේ ක්ෂනික වෙනස්වීම් ද සමාගමේ යහපත් කාර්යයසාධනයට බලපානු ලැබීය.

කුමක් වුවත්, ආයතනයේ සියලු සේවකයින්ගේ, විශේෂයෙන් මීහිතුල සේවකයින්ගේ සහයෝගය හා කැපවීම නොමැති වී නම් සමාලෝචිත වර්ෂය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම ලබාගත් සාර්ථකත්වය පහසු එකක් නොවනු ඇත. නිතරම අවධානමට නිරාවරණය වන මීහිතුල සේවකයින්ගේ මෙම දායකත්වය සැමවිටම මතක තබාගත යුතු හා අගය කොට සැලකිය යුතුය.

සමාලෝචිත වර්ෂය තුල සමාගමට මෙම දියුණුව ලඟා කර ගැනීමට සමාගමේ අධ්‍යක්ෂවරුන් නිරන්තරයෙන්ම කිසිදු වෙහෙසක් නොබලා ඔවුන්ගේ දායකත්වය හා අති විශාල ධෛර්යය ලබාදෙන ලදී.

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමා මෙම තනතුර මා වෙත ප්‍රදානය කිරීම වෙනුවෙන් මෙම අවස්ථාවේදී ස්තුති නොකලහොත් මා මෙම කාර්යය තුල අසාර්ථක වනු ඇත. ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමාටද, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙහි ගරු ලේකම්තුමා ඇතුළු සියලු කාර්ය මණ්ඩලයටද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇතුළු කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම වෙත සහයෝගය ලබාදුන් සියලු කාර්ය මණ්ඩලයටද, විශේෂයෙන් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ආයතනයේ සියළුම සේවකයන්ටද මා මේ අවස්ථාවේ අතිශයින් ස්තුතිවන්ත වෙමි. අවසාන වශයෙන් අප සමාගම වෙනුවෙන් මෙම වසරේදී ද කිසිම පැකිලීමකින් තොරව සමාගමේ විගණකවරු වශයෙන් තම විගණන කටයුතු නොපිරිහෙලා තෘප්තිමත් ලෙස ඉටු කල රණවීර නාගසිංහ සහ සමාගමේ වරලත් ගණකාධිකාරීවරුන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

අල්. හාජ්. එම්. අබ්දුල් මජීඩ්

සභාපති

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

2016 පෙබරවාරි මස 20 වැනිදා

# විගණන කමිටු වාර්තාව

## විගණන කමිටු කාර්ය භාර්ය

විගණන කමිටුවේ මූලික අරමුණ වන්නේ මූල්‍ය වාර්තාකරණයේ ඉහල ප්‍රමිතිය හා ගුණත්වය, අවධානම් කළමනාකරණය, ව්‍යවස්ථාපිත හා නීත්‍යානුකූල අවශ්‍යතාවයන්ට අනුකූල වීම, දිරිගැන්වීම හා ආරක්ෂා කිරීම, ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම වේ.

## විගණන කමිටු සංයුතිය

විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් එක් අයෙක් සභාපති වශයෙන්, සමාගමේ එකම කොටස්කරු වන මහා භාණ්ඩාගාරය විසින් නම් කරනු ලබන අතර සමාගමේ ලේකම්වරු කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ. අලුතින් පත් කරන ලද විගණන කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| එන්. පී. ඒ. ආර්. ජයවර්ධන මහත්මිය | - | සභාපති |
| බී. එස්. විමලසුන්දර මහතා | - | අධ්‍යක්ෂ |
| එන්. එල්. පල්ලෙපොල මහතා | - | අධ්‍යක්ෂ |

## රැස්වීම් සහ පැමිණීම

කමිටුව, අභ්‍යන්තර විගණන විමසුම් මගින් දක්වා ඇති කරුණු සම්බන්ධව ගැඹුරින් සාකච්ඡා කරනු ලැබේ. එහි දක්වා ඇති ගැටළු නිවැරදි කර ගැනීමට කළමනාකරණයට උපදෙස් ලබාදෙන අතර, සමහර ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමෙන් හෝ විමර්ෂණයෙන් පසුව තීරණය කල යුතු වේ.

## ක්‍රියාකාරකම්

කෙටුම්පත් ගිණුම්, බාහිර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තා ආදිය සමාලෝචනය හා සාකච්ඡා කිරීම තුලින් විගණන කමිටුවේ කාර්යයන් ඉටු කරනු ලැබේ. මෙම වාර්තා විගණන කමිටුව විසින් විමර්ශනය කල අතර නිර්දේශිත අතිරේක පාලන සහ අවදානම් අවම කිරීමේ උපක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් පවතින අභ්‍යන්තර පාලනය ශක්තිමත් කල යුතු අතර වැරදි, වංචාවන් සහ සමාගම විසින් මුහුණ දෙන මූල්‍ය හා මෙහෙයුම් අවධානම් අවම කල යුතුය.

අභ්‍යන්තර විගණක විසින් 2014/2015 සඳහා සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත් කලේද යන්න කමිටුව විසින් සොයා බලනු ලැබීය.

රජය වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 දී නව විගණන කමිටුවක් පත් කරනු ලැබූ අතර මෙම වාර්තාව පෙර විගණන කමිටුව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබේ.

කමිටුව වෙනුවෙන්

විගණන කමිටු සභාපති

## දැ ක් ම

"ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වාභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වීම."

## මෙ හෙ ව ර

"ස්වාභාවික මිනිරන් ඛණිජ සම්පත උපරිම ප්‍රයෝජනයට ගෙන, රටට විදේශ විනිමය උපයමින් හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කොටස්කරුවෙකු වීම."

## අ ර මු ණු

"මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි එකතු අගය උපරිම කිරීම. "

# සංවිධාන ව්‍යුහය

විධායක සභාපතිවරයකු සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම සංවිධානය වී තිබේ.

සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ සංවිධානය කර තිබේ.

- ✓ කැණීම
- ✓ සැකසුම්
- ✓ යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරු ශිල්පය
- ✓ අලෙවිකරණය
- ✓ පිරිස් අංශය
- ✓ පරිපාලනය
- ✓ මූල්‍ය කටයුතු සහ ගිණුම්කරණය
- ✓ සැපයීම් සහ ගබඩා අංශය
- ✓ සාමාන්‍ය සිවිල් ඉංජිනේරු අංශය
- ✓ ආරක්ෂක අංශය

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව

2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ලැබේ. එහි අඩංගු මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙල කොට ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### ප්‍රධාන කාර්යයන්

සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ,

1. 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය මඟින් පිහිටුවන ලද රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ පතල් ප්‍රදේශයේ නම් කර ඇති ව්‍යාපාරය පවත්වාගෙන යාම.

2. එකී රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාවේ කොලොන්ගහ - කහටගහ වශයෙන් නම් කර ඇති එම පාර්ශවයට අයත් කරගත් සහ පාර්ශවය විසින් පරිහරණය කරන ලද චංචල සහ නිශ්චල දේපල වල හිමිකම ලබා ගැනීම.

### මූල්‍යමය ප්‍රතිඵල

මූල්‍යමය ප්‍රතිඵල මූල්‍ය ප්‍රකාශන වල 03 සහ 04 වැනි පිටුවල සඳහන් කොට ඇත.

### දේපල, පිරියත සහ උපකරණ

එක් එක් වර්ෂය තුල දේපල, පිරියත සහ උපකරණ වල සංචලනයන් මූල්‍ය ප්‍රකාශන වල 18 වන සටහනෙහි දක්වා තිබේ.

### ආයෝජන

සමාගම රුපියල් මිලියන 7 ක මුදලක් සේවකයින්ගේ පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත.

### පරිත්‍යාග

ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුල, සමාගම විසින් පරිත්‍යාගයන් සිදු කර නැත.

### විගණකවරයාගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරයාගේ වාර්තාව, වාර්ෂික වාර්තාවට ඇතුලත් කොට තිබේ.

## අධ්‍යක්ෂවරුන්ගේ විශ්‍රාමය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත ඉස්මයිල් මොහමඩ් ජුනයිස් මහතා විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඔහු නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත **නයිනානායක පතිරන්නැහැලාගේ අනූජා රෝෂිණී ජයවර්ධන මහත්මිය** විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඇය නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව නැවත පත්වීමේ පදනම මත බන්දුල සේනාධි විමලසුන්දර මහතා විශ්‍රාම ගත විය යුතු වන අතර තනතුරෙහි අඛණ්ඩව සිටිනා අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ ඒකමතික සහයෝගය මත ඔහු නැවත තෝරා පත් කිරීමට සුදුසුකම් ලබයි.

## 2015 මාර්තු 31 දිනට අධ්‍යක්ෂවරු

2015 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ තනතුරු හොබවන ලද අයවලුන්ගේ නම් පහත දැක්වෙන පරිදි වේ.

**සම්පූර්ණ නම**

තුවාන් මොහමඩ් අසාම් බංසජයා මහතා

ඉස්මයිල් මොහමඩ් ජුනයිස් මහතා

වාසල මුදියන්සේලාගේ චමින්ද ප්‍රීතිවිරාජ් වාසල මහතා

මොහමඩ් ෂරීෆ් ලියාකත් අලිකාන් මහතා

නයිනානායක පතිරන්නැහැලාගේ අනූජා රෝෂිණී ජයවර්ධන මහත්මිය (2015 මාර්තු 20 දින පත්කරන ලදි.)

ධර්මසේන කලන්සූරිය, ඒ. යූ. එම්. යසීර් සහ අකලංකා රසුජානි වික්‍රමසිංහ යන මහත්ම මහත්මීන් පිළිවෙලින් 2015 ජනවාරි 22, 2015 ජනවාරි 30 සහ 2015 මාර්තු 20 දිනයන්හිදී සමාගමෙන් ඉවත්ව ගොස් ඇත. තුවාන් මොහමඩ් අසාම් බංසජයා මහතා 2015 අප්‍රේල් 27 වන දින ඉවත්ව ගොස් ඇත. වාසල මුදියන්සේලාගේ චමින්ද ප්‍රීතිවිරාජ් වාසල මහතා 2015 ජූනි 26 දින ඉවත්ව යන ලදි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, මුදල් අමාත්‍යාංශය විසින් පහත අයවලුන් අධ්‍යක්ෂ මණ්ඩලයට හා සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස නම්කර ඇත.

වගගේ දසනායක ජයසිංහ මහතා - 2015 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ අධ්‍යක්ෂවරයෙක් හා සභාපතිවරයා වශයෙන් පත් කරන ලදි. ඔහු 2015 ඔක්තොම්බර් 15 දින සමාගමෙන් ඉවත්ව යන ලදි.

මුල්ලේ විදානලාගේ දොන් නවීන් ලක්ෂිත පල්ලෙපොල මහතා - 2015 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලද අතර 2016 පෙබරවාරි 11 දින ඉවත්ව යන ලදි.

බන්දුල සේනාධි විමලසුන්දර මහතා - 2015 අප්‍රේල් 27 දින පත් කරනු ලැබීය.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, මුදල් අමාත්‍යාංශය විසින් පහත අය අධ්‍යක්ෂ මණ්ඩලයට හා සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස නම්කර ඇත.

අල්. හාජ්. මීරාසහීබු අබ්දුල් මජීඩ් මහතා - **2016 ජනවාරි 08** දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ අධ්‍යක්ෂවරයෙක් හා සභාපතිවරයා වශයෙන් පත් කරන ලදි.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශනවල 11 වැනි සටහනෙහි දක්වා තිබේ.

## සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධය

සමාගමේ කොන්ත්‍රාත්තු සහ යෝජිත කොන්ත්‍රාත්තු සමඟ අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතාව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුම හා විශ්වාසය අනුව, රජයට සහ සේවකයන්ට අදාල සියලු ව්‍යවස්ථාපිත ගෙවීම්, අද දින වන විට නිරවුල් කොට තිබීම හෝ සමාගමේ පොත් වලට ගෙන තිබීම පිළිබඳව අධ්‍යක්ෂවරු තෘප්තිමත්ය.

## ශේෂ පත්‍ර දිනෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනෙන් පසුව වැදගත් සිදුවීම් සලකා බැලූ අතර අවශ්‍ය විටදී, යෝග්‍ය ගැලපීම් සහ හෙළිදරව් කිරීම් කර ඇත.

## විගණකවරු

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුල, වරලත් ගණකාධිකාරීන් වන, රණවීර නාගසිංහ සහ සමාගම විගණකවරුන් වශයෙන් සේවය කොට ඇත. විගණකවරුන් වශයෙන් හැර වෙනත් සම්බන්ධතා නොතිබූ බව විගණකවරු සනාථ කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආචාරධර්ම සංග්‍රහයට අනුව ඔවුන් ස්වාධීන බව සනාථ කර ඇත.

මූල්‍ය වර්ෂය සඳහා, විගණකවරුන් සඳහා ගෙවිය යුතු ගාස්තු, මූල්‍ය ප්‍රකාශන වල 12 වැනි සටහනේ දක්වා ඇත.

විගණකවරුන් වශයෙන් තව දුරටත් කටයුතු කිරීම පිළිබඳ කැමැත්ත රණවීර නාගසිංහ සහ සමාගම විසින් ප්‍රකාශ කර ඇත. ඔවුන්ව නැවත පත් කිරීමට සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීමට යෝජනාවක් වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ඇත.

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි අත්සන් තබන ලදී.**

| | | |
|---|---|---|
| ……………………………….. | …………………………………… | …………………………… |
| **අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂ** | **ලේකම්වරු**<br>**එකවුන්ටිං සිස්ටම්ස් සෙක්රිටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්** |

# විශේෂ ගිණුම්කරණ තොරතුරු

## නිෂ්පාදනය

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 877 |
| 2009/10 | 915 |
| 2010/11 | 771 |
| 2011/12 | 888 |
| 2012/13 | 1018 |
| 2013/14 | 848 |
| 2014/15 | 712 |




## විකුණුම්

| වර්ෂය | මෙට්‍රික් ටොන් |
|---|---|
| 2008/9 | 497 |
| 2009/10 | 295.2 |
| 2010/11 | 760.3 |
| 2011/12 | 850.3 |
| 2012/13 | 537.8 |
| 2013/14 | 793 |
| 2014/15 | 708.5 |




## ආදායම

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 60.4 |
| 2009/10 | 21.1 |
| 2010/11 | 105 |
| 2011/12 | 128 |
| 2012/13 | 91.6 |
| 2013/14 | 143.6 |
| 2014/15 | 122.5 |




## දළ ලාභය

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 44.8 |
| 2009/10 | 13.1 |
| 2010/11 | 62.4 |
| 2011/12 | 74.9 |
| 2012/13 | 53.5 |
| 2013/14 | 91.36 |
| 2014/15 | 56.35 |




## බදු පෙර ශුද්ධ ලාභය

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 37.3 |
| 2009/10 | 1.5 |
| 2010/11 | 37.7 |
| 2011/12 | 54.3 |
| 2012/13 | 16.4 |
| 2013/14 | 21.18 |
| 2014/15 | -10.84 |




## ශුද්ධ වත්කම්

| වර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| 2008/9 | 4.4 |
| 2009/10 | 137 |
| 2010/11 | 166 |
| 2011/12 | 214 |
| 2012/13 | 423.4 |
| 2013/14 | 367.5 |
| 2014/15 | 337 |



# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## වාර්ෂික ගිණුම්
## 2014/15

## 2014 අප්‍රේල් 01 සිට 2015 මාර්තු 31 දක්වා

**රණවීර, නාගසිංහ සහ සමාගම**
**වරලත් ගණකාධිකාරීවරුන්**

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්
## ගිණුම් 2014/2015

| <u>අන්තර්ගතය</u> | <u>පිටුව</u> |
|---|---|
| ආයතනික තොරතුරු | 01 |
| විගණකවරුන්ගේ වාර්තාව | 02 |
| විස්තිරණ ආදායම් ප්‍රකාශය | 03-04 |
| මුල්‍ය තත්ව ප්‍රකාශනය | 05 |
| ස්කන්ධ වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 06 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 07 |
| වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති | 08- 17 |
| ගිණුම් සඳහා සටහන් | 18 - 26 |
| ආදායම් බදු ගණනය කිරීම | 27-29 |

# <u>කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්</u>

## 1 ආයතනික තොරතුරු

### *2015 මාර්තු 31 දිනට සංස්ථාපනය පිළිබඳ විස්තර*

***සමාගමේ නම***

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

***නෛතික ස්වභාවය***

මුදල් අමාත්‍යාංශය යටතේ ඇති සීමිත වගකීම් සහිත පොදු සමාගමකි.

***ලියාපදිංචි කාර්යාලය***

අංක 561/3, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

***ව්‍යවස්ථාපිත තත්වය***

1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමිත වගකීම් සහිත පොදු සමාගමකි.

***සමාගම් ලියාපදිංචි අංකය***

PB 1513

***අධ්‍යක්ෂ මණ්ඩලය***

ඩී. කලන්සූරිය මහතා (2015/01/22 දින ඉල්ලා අස්වී ඇත)
ඒ. යූ. එම්. යසීර් මහතා (2015/01/30 දින ඉල්ලා අස්වී ඇත)
ඒ. ආර්. වික්‍රමසිංහ මහත්මිය
අයි. එම්. ජුනයිස් මහතා
ටී. එම්. ඒ. බංසජයා මහතා
ඩබ්. එම්. සී. පී. වාසල මහතා
එම්. එස්. එල්. අලී ඛාන් මහතා

***සමාගම් ලේකම්***

එකවුන්ටිං සිස්ටම්ස් සෙක්රිටේරියල් සර්විසස් ( ප්‍රයිවට්) ලිමිටඩ්
අංක 02, කාසල් වීදිය, කොළඹ 04.

***සමාගමේ විගණකවරු***

රණවීර, නාගසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
අංක 277, නව හුණුපිටිය පාර, දළුගම, කැළණිය.

***බැංකුකරු***

ලංකා බැංකුව, කොල්ලුපිටිය සහ රිදීගම ශාඛා

රණවීර, නාගසිංහ සමාගම.
වරලත් ගණකාධිකාරීවරුන්

එස්. රණවීර, A. C. A
එනනාගසිංහ, B.Sc., F. C. A.
ඩබ්.එස්. රොෂාන් ද සොයිසා, B.Sc., A. C. A.

කොළඹ කාර්යාලය:
අංක : 277,
නව හුණුපිටිය පාර,
දළුගම,
කැළණිය.
දු.ක. / ෆැක්ස් : 0112910571, 2905196

ප්‍රධාන කාර්යාලය:
අංක : 41/5 බී,
පැරණි වෙළඳපොළ පාර
කොටුවේගොඩ,,
මාතර.
දු.ක.:041 2222365,041 2221415

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගමේ සමාජිකයින් වෙත

### *මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ වාර්තාව*

මේ සමඟ ඇති කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම 2015 මාර්තු 31 දිනට වූ මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය හා වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වලින් යුක්ත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

### *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකාරීත්වයේ වගකීම*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වනු ලැබේ. එසේම වැරදි හෝ වංචා නිසා සිදුවන ප්‍රමාණාත්මක වැරදි වලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාලව කළමනාකරණය විසින් අවශ්‍ය යැයි නිර්ණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාමද ඇතුලත් වේ.

### *විගණකවරුන්ගේ වගකීම*

අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අනුව අපගේ විගණනය සිදු කලෙමු. එම ප්‍රමිතීන්ගේ නියමය පරිදි මූල්‍ය ප්‍රකාශන එහි ආචාර ධර්ම පද්ධතීන් වලට අනුකූල බවට හා සාවද්‍ය තොරතුරු වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීම සඳහා අපගේ විගණනය සැලසුම් කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන වල ගණනය කිරීම් හා හෙළිදරව් කිරීම් වල විගණන සාක්ෂි ලබාගැනීම සඳහා වන ක්‍රියාපටිපාටීන් ඉටුකිරීමට විගණනය දායක වේ. සාවද්‍ය තොරතුරු වලින් හෝ වැරදි හා වංචා වලින් මූල්‍ය ප්‍රකාශන වලට සිදුවන හානි ඇගයීම ද ඇතුලත්ව තෝරාගත් ක්‍රියාපටිපාටීන් විගණකගේ විනිශ්චය මත රඳා පවතී. විගණක විසින් මෙම හානිදායක තත්වයන් ඇගයීම සිදු කරනුයේ සම්පූර්ණ අන්තර් පාලනයන්ගේ කාර්යක්ෂමතාවය පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමේ අරමුණකින් නොවන අතර හුදෙක්ම මෙහිදී විගණන ක්‍රියාපටිපාටිය පිළියෙල කිරීමේ කාර්යයේදී අවස්ථානුකූලව මූල්‍ය ප්‍රකාශන වල නිසි පිළියෙල කිරීම් සහ නිසි ඉදිරිපත් කිරීම් වලට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ සැලකිලිමත් වේ. තවද කළමනාකරණය විසින් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරමින් යුක්තිසහගත ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කරනවාද යන්නත් එලෙසම මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරනවාද යන්නත් ඇගයීම විගණනයකට ඇතුලත් වේ.

අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ විගණන මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා යෝග්‍ය බව අප විශ්වාස කරමු.

අප අපගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට අපගේ විගණන අරමුණු වලට සුදුසු වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගත්තෙමු. එම නිසා අපගේ විගණනය අපගේ මතයට සාධාරණ පදනමක් සපයනු ඇතැයි යනු අපගේ විශ්වාසයයි.

### *මතය*

අපගේ මතය අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2015 මාර්තු 31 දිනෙන් අවසන්, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන තුලින් එහි මූල්‍ය තත්වයෙහි, මූල්‍යමය ක්‍රියාකාරීත්වයෙහි සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දේ.

### *වෙනත් නිත්‍යානුකූල අවශ්‍යතාවයන් වාර්තා කිරීම*

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ වගන්ති 151(1) අවශ්‍යතාවයන් අනුව පිළියෙල කර ඇත.

රණවීර නාගසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ.
2015 සැප්තැම්බර් 04.

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මිනිරන් විකුණුම් | 08 | 122,559,438.42 | 144,111,798.15 |
| සෘජු පිරිවැය, කැණීම් පිරිවැය | 09 | (66,200,141.64) | (52,750,707.80) |
| **දළ ලාභය/(අලාභය)** | | **56,359,296.78** | **91,361,090.35** |
| වෙනත් ආදායම් | 10 | (189,636.59) | (312,941.13) |
| | | 56,169,660.19 | 91,048,149.22 |
| **අඩුකලා: මෙහෙයුම් පිරිවැය** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 11 | (17,035,760.85) | (15,394,843.66) |
| ආයතනික සහ පරිපාලන පිරිවැය | 12 | (17,430,868.17) | (17,778,483.25) |
| නඩත්තු පිරිවැය | 13 | (1,778,305.10) | (1,339,248.06) |
| උපයෝගී පිරිවැය | 14 | (514,497.87) | (599,029.49) |
| ක්ෂය පිරිවැය | 15 | (22,056,937.29) | (20,167,747.60) |
| විකිණීමේ හා බෙදාහැරීමේ පිරිවැය | 16 | (2,347,142.16) | (3,877,278.11) |
| පාරිතෝෂික | | (2,548,856.89) | (2,229,903.20) |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 17 | (3,305,849.68) | (8,473,835.17) |
| **මුලු මෙහෙයුම් පිරිවැය** | | **(67,018,218.01)** | **(69,860,368.54)** |
| **බදු පෙර ලාභය /(අලාභය)** | | (10,848,557.83) | 28,215,068.40 |
| බදුකරණය | | (44,654.83) | (3,847,066.52) |
| **වර්ෂය සඳහා බදු පසු ලාභය / (අලාභය)** | | **(10,893,212.66)** | **17,340,714.15** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විදේශ විනිමය ලාභ/ අලාභ | | (2,205,201.22) | (1,942,245.39) |
| විලම්භිත බදු වියදම් | | (1,152,416.33) | - |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්** | | (3,357,617.55) | (1,942,245.39) |
| **වර්ෂය සඳහා මුලු විස්තීර්ණ ආදායම** | | **(14,250,830.21)** | **15,398,468.76** |

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## මූල්‍ය තත්ව ප්‍රකාශනය

| මාර්තු 31 දිනට | සටහන් | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 18 | 259,309,170.39 | 267,234,317.20 |
| පොල් වගාව සංවර්ධනය | | 1,694,235.36 | 1,694,235.36 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම | | 7,000,000.00 | 5,675,000.00 |
| | | **268,003,405.75** | **274,603,552.56** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 19 | 84,338,799.64 | 105,267,315.56 |
| ණයගැතියෝ, තැන්පතු සහ ලැබිය යුතු දෑ | 20 | 12,252,300.69 | 9,889,269.61 |
| මුදල් හා මුදල් සමාන දෑ | 21 | 3,294,704.08 | 13,800,259.29 |
| | | **99,885,804.41** | **128,956,844.46** |
| **මුළු වත්කම්** | | **367,889,210.16** | **401,866,161.66** |
| **ස්කන්ධ හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 22 | 13,000,000.00 | 13,000,000.00 |
| රඳවා ගත් ඉපැයීම් | | 73,750,228.61 | 104,297,609.08 |
| සංචිත | 23 | 250,220,462.70 | 250,220,462.70 |
| | | **336,970,691.31** | **367,518,071.78** |
| **දිගුකාලීන බැරකම්** | | | |
| විලම්භිත බදු බැරකම් | | 2,697,132.09 | - |
| ගෙවිය යුතු ලීසින් වාරික | 24 | - | 3,662,917.77 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 7,249,711.45 | 6,003,227.56 |
| | | **9,946,843.54** | **9,666,145.33** |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු ලීසින් වාරික | 24 | 2,276,240.17 | 2,353,829.64 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියෝ | 25 | 500,276.84 | 919,065.85 |
| ගෙවිය යුතු ලාභාංශ | 26 | - | 845,516.64 |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 27 | 8,289,323.13 | 13,863,150.22 |
| උපචිත වියදම් | 28 | 9,905,835.17 | 6,700,382.20 |
| | | **20,971,675.31** | **24,681,944.55** |
| **මුලු ස්කන්ධ හා බැරකම්** | | **367,889,210.16** | **401,866,161.66** |
| **කොටසක ශුද්ධ වත්කම් අගය** | | **259.21** | **282.71** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පිළියෙල කර ඇති බව මම සහතික කරමි.

.......................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වන අතර අනුමත කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

............................... ..................................
අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

### ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | කොටස් ප්‍රාග්ධනය<br>රු. | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. | සමුච්චිත ලාභය/(අලාභය)<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| **2013 අප්‍රේල් 01 දිනට ශේෂය** | 13,000,000.00 | 237,113,746.70 | 160,276,371.37 | 410,390,118.07 |
| පෙර වර්ෂය සඳහා වන ගැලපුම් (තොග ගැලපුම් මත පැන නැගුනු ) | - | 13,106,716.00 | (70,437,768.12) | (57,331,052.12) |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | 17,340,714.15 | 17,340,714.15 |
| ලාභාංශ ප්‍රකාශ කිරීම 2013 | - | - | (939,462.93) | (939,462.93) |
| වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් | - | - | (1,942,245.39) | (1,942,245.39) |
| **2014 මාර්තු 31 දිනට ශේෂය** | **13,000,000.00** | **250,220,462.70** | **104,297,609.08** | **367,518,071.78** |
| **2014 අප්‍රේල් 01 දිනට ශේෂය** | 13,000,000.00 | 250,220,462.70 | 104,297,609.08 | 367,518,071.78 |
| පෙර වර්ෂයේ ගැලපුම් (සටහන 1) | - | - | (16,175,795.32) | (16,175,795.32) |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | (14,250,830.21) | (14,250,830.21) |
| ලාභාංශ ප්‍රකාශ කිරීම 2014 | - | - | (120,754.93) | (120,754.93) |
| **2015 මාර්තු 31 දිනට ශේෂය** | **13,000,000.00** | **250,220,462.70** | **73,750,228.61** | **336,970,691.31** |

**පෙර වර්ෂය සඳහා ගැලපුම් (සටහන 1)**

| | |
|---|---|
| වර්ෂ ආරම්භක තොග අව ගණනය කිරීම | (14,631,079.56) |
| විලම්භිත බදු | (1,544,715.76) |
| | (16,175,795.32) |

**කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2015** රු. | **2014** රු. |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් (කටයුතු වල භාවිතා කිරීමෙන් ) ලද මුදල් ප්‍රවාහ** | | |
| ආදායම් බදු වියදම් වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය) | (10,848,558) | 21,187,781 |
| ගැලපීම් | | - |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,548,857 | 2,229,903 |
| කල්බදු පොලිය | 229,669 | - |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | (14,631,080) | (66,396,404) |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මත ක්ෂය | 22,056,937 | 20,167,748 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමේ අලාභය | 655,301 | - |
| ගෙවන ලද පාරිතෝෂික | (1,302,373) | (914,996) |
| විදේශ විනිමය අලාභ | (2,205,201) | (1,942,245) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | **(3,496,447)** | **(25,668,214)** |
| | | |
| තොග (වැඩිවීම්) /අඩුවීම් | 20,928,516 | 30,247,641 |
| ලැබිම් යුතු දෑ (වැඩිවීම්) /අඩුවීම් | (2,363,031) | 18,166,869 |
| ණයහිමියන් (අඩුවීම්) /වැඩිවීම් | (418,789) | (418,382) |
| උපචිත වියදම් (අඩුවීම්) / වැඩිවීම් | 3,205,453 | 37,114 |
| **මෙහෙයුම් කටයුතු වලින් /(කටයුතු වල යෙදීමෙන් )ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **21,352,149** | **48,033,241** |
| | | |
| **ආයෝජන කටයුතු වලින් (කටයුතු වලට යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මිලට ගැනීම | (16,481,327) | (31,325,483) |
| ස්ථාවර තැන්පතු | - | 27,723,834 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන | (1,325,000) | (675,000) |
| **ආයෝජන කටයුතු වලින් (කටයුතු වලට යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(17,806,327)** | **(4,276,649)** |
| | | |
| **මූල්‍ය කටයුතු වලින් (කටයුතු වල යෙදීමෙන්) ලද මුදල් ප්‍රවාහ** | | |
| බැංකු ණය ගෙවීම් | - | (2,500,000) |
| ආදායම් බදු ගෙවීම් | (5,524,536) | (6,495,788) |
| ලාභාංශ බදු ගෙවීම් | (93,946) | (3,702,987) |
| ලාභාංශ ගෙවීම් | (966,272) | - |
| කල්බදු ගෙවීම් | (3,970,176) | (3,298,799) |
| **මූල්‍ය කටයුතු වලින් (කටයුතු වල යෙදීමෙන්) ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(10,554,929)** | **(15,997,574)** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දේවල් වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)** | (10,505,555) | 2,090,805 |
| වර්ෂ ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේවල් | 13,800,259 | 11,709,455 |
| **වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දේවල්** | **3,294,704** | **13,800,259** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව - රිදීගම | (1,661,921) | 188,365 |
| ලංකා බැංකුව - කොල්ලුපිටිය | (127,597) | 36,788 |
| වාසික විදේශ ව්‍යවහාර ඩොලර් ගිණුම - ලංකා බැංකුව, කොල්ලුපිටිය | 5,046,052 | 13,541,287 |
| සුලු මුදල් - ප්‍රධාන කාර්යාලය | 29,000 | 23,399 |
| සුලු මුදල් - පතල් කාර්යාලය | 9,170 | 10,420 |
| | **3,294,704** | **13,800,259** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## 2015 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් යනු, 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසායන් පුනරුත්ථාපනය කිරීමේ පනත යටතේ වර්ෂ 1997 දී රජයට නැවත පවරනු ලැබුවාවූද, මීට ඉහතදී 'ජනතාකරණය' කරනු ලැබ තිබුණා වූද සමාගමකි. දැනට එය සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාරයක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වෙමින් පවතියි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 561/3, ඇල්විටිගල මාවත නාරාහේන්පිට, කොළඹ 05. වේ.

### 1.2 ප්‍රධාන කාර්යයන් සහ කාර්යයන් වල ස්වභාවය

කාලපරිච්ඡේදය තුල මිනිරන් නිෂ්පාදනය සහ අපනයනය කිරීම සමාගමේ ප්‍රධාන කාර්යය විය.

### 1. 3 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම වේ.

### 1.4 නිකුත් කිරීමට බලය ඇති දිනය

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයකට අනුකූලව 2015 සැප්තැම්බර් මස 07 වන දින නිකුත් කිරීම සඳහා බලය පවරනු ලැබීය.

## 2 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.1 පිළියෙල කිරීමේ පදනම

විශේෂයෙන් දක්වා ඇති දැ හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. විශේෂයෙන් දක්වා ඇති දැ හැර මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර ඇත.

### 2.2 අනුකූලතා ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් වන එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS) හා එල්.කේ.ඒ.එස්. (LKAS) (මින් ඉදිරියට එස්.එම්.ඊ. (SME) සඳහා එස්.එල්.එෆ්.ආර්.එස්. (SLFRS) ලෙස දක්වනු ලැබේ. ) අනුව පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇත.

සාධාරණ අගය උපකල්පිත පිරිවැය අතහැරීම වශයෙන් ආයතනය සාධාරණ අගය හෝ ප්‍රත්‍යාගණනය තෝරාගෙන නොමැති අතර පිරිවැය හා ප්‍රත්‍යාගණනය කල්පිත අගය ලෙස සලකා ඇත.

ආයතනය විසින් එස් එල් එෆ් ආර් එස් වලට අනුව ප්‍රථම ගිණුම් පිළියෙල කිරීමේදී 2014 අප්‍රේල් 01 වන දිනෙන් ඉදිරියට සියළුම ගිණුම් වර්ෂ සඳහා අඛණ්ඩව එස් එල් එෆ් ආර් එස් අනුගමනය කරමින් එදිනට එම ගිණුම්කරණ ප්‍රමිතින් පැවතුනා සේ වන පරිදි ගිණුම් පිළියෙල කර ඇත.
ආදායම හා වියදම ගැලපීමේදී උපචිත පදනම අනුගමනය කර ඇත.

## 2.3 වැදගත් ගිණුම්කරණ තීරණයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්, සහ පවත්නා හෙළිදරව් කිරීම් සහ අසම්භව්‍ය බැරකම් වල හෙළිදරව් කිරීම් හි වාර්තාගත වටිනාකම් වලට බලපාන, තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකස් කිරිම සඳහා කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. මෙම උපකල්පන වල සහ ඇස්තමේන්තු වල අස්ථිරභාවය අනාගතයේදී වත්කමක හෝ බැරකමක ධාරණ අගයෙහි වැදගත් වෙනස්වීමක් සඳහා බලපානු ඇත.

**තීරණයන්**

සමාගම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී කළමණාකරණය විසින්, මූල්‍ය වාර්තා තුලින් හදුනාගත හැකි, වටිනාකම් මත වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කරන පහත සඳහන් තීරණයන් ගෙන ඇත.

**අ.) දේපල වර්ගීකරණය**

ආයතනය විසින් දේපල ආයෝජන දේපලක් වශයෙන් වර්ග කරනවාද, නැතහොත් අයිතිකරු භුක්තිවිඳින දේපලක් වශයෙන් වර්ග කරනවාද යන්න තීරණය කරනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි ඇතුලුව ආයෝජන දේපල ප්‍රමාණාත්මක වශයෙන් භාවිතා නොකලේනම් හෝ ආයතනයේ මෙහෙයුම් කටයුතු වලට භාවිතා නොකලේ නම් හෝ සාමාන්‍ය විකුණුම් කටයුතු සඳහා නොවන්නේ නමුත් මූලික වශයෙන් කුලී ආදායම් ඉපැයීමට හා ප්‍රාග්ධනය වර්ධනය කරගැනීමට ආයතනය විසින් දේපල ආයෝජන දේපලක් වශයෙන් වර්ගීකරණය කිරීමේදී, එම ආයෝජන දේපල අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව මුදල් ප්‍රවාහයන් උත්පාදනය කරන්නේද යන්න සලකා බලනු ලැබේ. අයිතිකරු පාරිභෝජනය කරන දේපල, දේපල වලට පමණක් නොව නිෂ්පාදන හෝ සැපයුම් කටයුතු වල භාවිතා කරන අනෙකුත් වත්කම් වලින්ද මුදල් ප්‍රවාහයන් උත්පාදනය වේ. සමහර වත්කම් ගොන්නක් වශයෙන් පවතින අතර ඒවා කුලී ආදායම් ඉපැයීම හෝ ප්‍රාග්ධන උත්පාදනය කර ගැනීමට පවත්වාගෙන යන අතර අනෙකුත් ගොනු භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීම හෝ පරිපාලන අරමුණු සඳහා පවත්වාගෙන යනු ලැබේ. මෙම වත්කම් ගොනු වෙන් වෙන් වශයෙන් විකිණීමට හැකිනම් (මූල්‍ය කල්බදු යටතේ බදු දීම) හෝ වෙනම මූල්‍ය ගිණුම් පිළියෙල කරනු ලැබේ. ගොනුව වෙන් වෙන් වශයෙන් විකිණීමට නොහැකි නම්, දේපල ආයෝජන දේපලක් වශයෙන් ප්‍රමාණාත්මක නොවන ගොනුවක් භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හෝ සැපයීමට හෝ පරිපාලන අවශ්‍යතාවයන්ට යටත්ව ගිණුම්කරණය කරනු ලැබේ. අතිරේක සේවාවන් ඉතා වැදගත් ද යන්න දේපල ආයෝජන දේපලක් වශයෙන් සුදුසුද යන්න තීරණය කිරීමේදී වැදගත් වේ. ආයතනය තීරණ ගැනීමේදී එකිනෙක වත්කම් වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලැබේ.

**ආ.) ඇස්තමේන්තු සහ උපකල්පන**

ප්‍රධාන උපකල්පන අනාගතය තීරණය කරන අතර ඇස්තමේන්තු වල, මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම් වල ධාරණ අගයෙහි සැලකිය යුතු වෙනස්වීමකට හේතුවන, සැලකිය යුතු අවධානමක් ඇති, පහත විස්තර කර ඇති, අනෙකුත් ප්‍රධාන ප්‍රභවයන් වාර්තාකරන දිනයේදී නිමානය කිරීම අවිනිශ්චිත වේ. සමාගම එහි මූල්‍ය වාර්තා සකස් කිරීමේදී පරාමිතීන් මත පවතින උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කර ගනී. අනාගත සංවර්ධනය පිළිබඳ පවතින වාතාවරණයන් සහ උපකල්පනයන් කෙසේ වෙතත් වෙළඳපොල වෙනස්වීම් හෝ සමාගමේ පාලනය තුලින් මතුවන සිද්ධීන් හේතුවෙන් වෙනස් විය හැක. උපකල්පනයන්හි එවැනි වෙනස්කම් මතුවන අවස්ථාවේදීම හරවා යවනු ලැබේ.

**ඇ.) බදුකරණය**

විලම්බිත බදු වත්කම් භාවිතා නොකල බදු අලාභයන් ලෙස හඳුනාගත හැකි අතර එහි සසම්භාවී ප්‍රමාණයට එරෙහිව අලාභයන් උපයෝජනය කල හැකි දේවල් බදු අය කල හැකි ලාභය ලෙස පැවතිය හැක. විලම්භිත බදු වත්කම් අගය තීරණය කිරීම සඳහා වැදගත් කළමනාකරණ තීරණයන් අවශ්‍ය වන අතර ඒවා කාලානුරූපතාව සහ අනාගත බදු අයකල හැකි ලාභයන් සමග අනාගත බදු සැලසුම් උපායමාර්ගයන් මත පදනම්ව හඳුනාගත හැකි වේ.

**ඈ.) සේවක ප්‍රතිලාභ**

සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි නිර්දේශයන් අනුව ප්‍රක්ශිප්ත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කරමින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම වන පාරිතෝෂික මුදලින් පොරොන්දු වූ විශ්‍රාම ප්‍රතිලාභයන්ගේ වර්තමාන අගය මනිනු ලැබේ.

**ඉ.) මූල්‍ය නොවන වත්කම් හානිකරණය.**

ආයතනය වාර්තා කරන සෑම දිනයකම මූල්‍ය නොවන වත්කම් සඳහා යම් හානිකරණ තත්වයක් ඇත්ද යන්න තක්සේරු කරනු ලැබේ. ගෙනයන අගය නැවත අයකර ගත නොහැකි තත්වයක් පෙන්නුම් කරනවිට මූල්‍ය නොවන වත්කම් හානිකරණයන් සඳහා පරීක්ෂා කරනු ලැබේ.

**ඊ.) වෙළඳ හා අනෙකුත් ලැබියු යුතු දෑ හානිකරණය**

ආදායම් වාර්තා වල හානිකරණයන් වාර්තා කල යුතු ද යන්න තක්සේරු කිරීම සඳහා ආයතනය විසින් සියලු ලැබිය යුතු දෑ වාර්තා කරන සෑම දිනකම සමාලෝචනය කරනු ලැබේ. ගෙවිය යුතු වියදම් වල කාලසීමාව සහ කළමනාකරණය විසින් අවධානය යොමු කරන, නැවත අය කරගත නොහැකි භාවයක් පෙන්නුම් කරන වෙනත් සාධකයන් පිළිබඳව සලකා බලමින් එවැනි ලැබිය යුතු දෑ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකරණය විසින් තීරණයන් යොදා ගනී.

## 2.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 2.4.1 ආදායම හඳුනාගැනීම

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති, ආදායම විශ්වාසයෙන් මැනිය හැකි, ගෙවීම් කරන තෙක් නොසලකා හරින, සසම්භාවී ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගෙවීම් සහ බැහැර කල බදු හෝ තීරු බදු වල ගිණුම්කරණ ගිවිසුම්ගත නිශ්චිත කොන්දේසි වලට අනුකූලව ලැබුනු සහ ලැබිය හැකි දේවල් වල සාධාරණ අගයට ආදායම මනිනු ලැබේ.

**අ. අපනයන ආදායම**
අපනයන ආදායම සත්‍ය අපනයන මත පදනම්ව උපචිත පදනම මත හඳුනාගනී.

**ආ. පොලී ආදායම**
පොලී ආදායම ලද අවස්ථාවේදී ම ගිණුම්ගත කරනු ලැබේ.

**ඇ. වතුවගා ආදායම**
වතු එලදාවෙන් ලැබෙන ආදායම මුදල් පදනම මත හඳුනා ගැනේ.

**ඇ. වෙනත් ආදායම්**
වෙනත් ආදායම් සත්‍ය පිරිවැය පදනමට හඳුනාගැනේ.

### 2.4.2 වියදම්

වර්ෂය සඳහා ලාභ/ (අලාභ) ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දැරීමට සිදු වන සියළු වියදම්, උපචිත පදනම මත ආදායමෙන් අයකරගෙන ඇත.

### 2.4.3 බදුකරණය

#### අ.) ප්‍රවර්තන බදු

ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ බැරකම්, ප්‍රවර්තන වර්ෂයට සහ පෙර වර්ෂ වලට අදාලව බදු අධිකාරීත්වයට ගෙවූ හෝ යලි අයකර ගැනීමට අපේක්ෂා කරන අගයට හඳුනාගනී. වාර්තා කරන දිනය වන විට පනවන ලද හෝ ස්වාධීන ලෙස පනවනු ලැබූ වටිනාකම් ගණනය කිරීම සඳහා බදු අනුපාතයන් හා බදු නීතීන් යොදා ගනී.

#### ආ.) විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය වෙනුවෙන් වාර්තා කරන දිනය වන විට, බදු පදනමට සකස් කෙරෙන වත්කම්, වගකීම් සහ ඒවායේ ධාරණ අගයන් තුල විලම්භිත බදු තාවකාලික වෙනස්කම් මත, වාර්තාකරන දිනයේ දී ඇතුලත් කරනු ලැබේ. සියලු බදු අයකල හැකි තාවකාලික වෙනස්කම් විලම්භිත බදු බැදියාවන් ලෙස හඳුනාගැනේ. ඉදිරියට ගෙන ආ භාවිතා නොකල බදු ණය සහ වෙනත් භාවිතා නොකල බදු අලාභයන් වැනි සියලු අඩුකල හැකි තාවකාලික වෙනස්කම් විලම්භිත බදු වත්කම් ලෙස හඳුනා ගනී. අඩු කල හැකි තාවකාලික වෙනස්කම් වලට එරෙහිව පවතින, සසම්භාවී ප්‍රමාණයට හඳුනාගන්නා බදු අය කල හැකි ලාභය විලම්භිත බදු වත්කම් ලෙස හඳුනාගන්නා අතර ඉදිරියට ගෙන ආ, භාවිතා නොකල බදු ණය සහ භාවිතා නොකල බදු අලාභයන් උපයෝජනය කල හැකි වේ.

එක් එක් වාර්තා කරන දිනයන් වලදීම විලම්භිත බදු වත්කම්හි ධාරණ අගය සමාලෝචනය කර උපයෝජනය කිරීමට පවතින සියලුම විලම්භිත බදු වත්කම් හෝ විලම්භිත බදු වත්කම් වල කොටසක් ප්‍රමාණවත්, සසම්භාවී බදු අයකල හැකි ලාභයක් නොමැතිනම් එම ප්‍රමාණයෙන්ම අඩුකරනු ලැබේ.

වාර්තා කරන දිනය වන විට පනවන ලද හෝ ස්වාධීන ලෙස පනවනු ලැබූ බදු අනුපාතයන් (සහ බදු නීති) මත පදනම්ව වත්කම අත්පත් කරගත් හෝ වගකීම පියවූ වර්ෂයට අදාල කරගැනීමට බලාපොරොත්තු වන බදු අනුපාතයන් මත විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ. හඳුනානොගත් විලම්භිත බදු වත්කම් ඒ ඒ වාර්තා කරන දිනයන්හි නැවත අගය කරන අතර අයකර ගැනීමට ඇති විලම්භිත බදු වත්කම් වල අනාගත බදු අයකරගත හැකි ලාභය ලියාහැර එය සසම්භාවී වූ ප්‍රමාණයට හඳුනාගනී.

වාර්තා කරන දිනය වන විට පනවන ලද හෝ ස්වාධීන ලෙස පනවනු ලැබූ බදු අනුපාතයන් (සහ බදු නීති) මත පදනම්ව වත්කම අත්පත් කරගත් හෝ වගකීම පියවූ වර්ෂයට අදාල කරගැනීමට බලාපොරොත්තු වන බදු අනුපාතයන් මත විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

විලම්භිත බදු භාහිර ආදායම් ප්‍රකාශනයට අදාල අයිතමයක් ලෙස හඳුනාගෙන ඇත. විලම්භිත බදු අයිතම විශේෂ ගනුදෙනු සමග සම්බන්ධතාවයක් නොමැතිනම් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ඍජුවම සමකොටස් ලෙස හඳුනා ගනී.

වර්තමාන බදු වගකීම් වෙනුවට වර්තමාන බදු වත්කම් හිලව් කිරීමට නීතියෙන් බලාත්මක කල හැකි අයිතිවාසිකමක් පවතීනම් විලම්භිත බදු වත්කම් සහ විලම්භිත බදු බැරකම් හිලව් කරනු ලබන අතර සහ විලම්භිත බදු, බදු අයකල හැකි අස්ථිතිත්වයට හෝ බදු අධිකාරියට අදාල වේ.

#### ඇ.) විකුණුම් බදු

